රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව

அரச நிதித் திணைக்களம்

DEPARTMENT OF PUBLIC FINANCE

මහා භාණ්ඩාගාරය, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යංශය, කොළඹ-01, ශ්‍රී ලංකාව.

பொதுத் திறைசேரி, நிதி திட்டமிடல் அமைச்சு, கொழும்பு-01, இலங்கை.

General Treasury, Ministry of Finance and Planning, Colombo-01, Sri Lanka.

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General — Tel. 94-11-2484614, Fax. 94-11-2436337

කාර්යාලය / அலுவலகம் / Office — Tel. 94-11-2484637, Fax. 94-11-2431458

Website: www.pfd.gov.lk
E-mail: pubfin@pfd.treasury.gov.lk


මගේ අංකය / எனது இல / My No: PFD/PMD/Gen/003

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2014.05. 29

ලේකම්

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

**දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුවල අධිකාරි සීමාව**

කොන්ත්‍රාත් පිරිනැමීම තීරණය කිරීම සඳහා වූ ප්‍රසම්පාදන කමිටුවල අධිකාරි සීමාවන් සංශෝධනය කරමින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ - 2006 සඳහා නිකුත් කරන ලද 2011.01.01 දිනැති අංක 20 අතිරේකය සහ 2012.02.23 දිනැති අංක 21 අතිරේකය හා බැඳේ.

2. ඉහත අංක 20 අතිරේකය අනුව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවල අධිකාරි සීමාවට ගැනෙන දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුවට විවෘත තරඟකාරි ලංසු ක්‍රමය යටතේ දේශීය අරමුදල් මඟින් කෙරෙන දිසාපති / දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල වැඩ, භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනයන් සඳහා රුපියල් මිලියන 50 දක්වාද, විදේශීය අරමුදල් මඟින් කෙරෙන එවැනි ප්‍රසම්පාදනයන් සඳහා රුපියල් මිලියන 150 දක්වාද වූ මූල්‍ය සීමාවන් යටතේ කටයුතු කළ හැකිවේ.

3. මේ වන විට විවිධ රේඛීය අමාත්‍යාංශ විසින් දිසාපති / දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත නිදහස් කරන ලද විශාල ප්‍රතිපාදන ප්‍රමාණයක් යටතේ දිවි නැගුම, මග නැගුම, දැයට කිරුළ වැනි බොහෝ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කෙරෙන බැවින් ඒවාට අදාළ ඉදිකිරීම් වැඩ ඇතුළු අනෙකුත් ප්‍රසම්පාදනයන් ප්‍රමාදයකින් තොරව අඛණ්ඩව සිදුකිරීමට පවතින අධිකාරි සීමාවන් සංශෝධනය විය යුතු බවට ඉල්ලීම් රාශියක් ඉදිරිපත් වී ඇත.

4. මෙම තත්ත්වය සැලකිල්ලට ගෙන දේශීය අරමුදල් මඟින් කෙරෙන වැඩ, භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය සඳහා දැනට පවතින රුපියල් මිලියන 50 සීමාව රුපියල් මිලියන 100 දක්වාද, විදේශීය අරමුදල් මඟින් කෙරෙන වැඩ, භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය සඳහා දැනට පවතින රුපියල් මිලියන 150 සීමාව රුපියල් මිලියන 300 දක්වාද වන පරිදි දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුවල මූල්‍ය සීමාවන් සංශෝධනය කිරීම සඳහා වූ යෝජනාවක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබේ.

5. තවද, ඉහත අංක 21 අතිරේකය අනුව වෙළඳපොළ මිල සැදහුම් ක්‍රමය (Shopping Procedure) යටතේ දිසාපති / දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වැඩ, භාණ්ඩ හා සේවාවන් ප්‍රසම්පාදනය සඳහා දැනට පවතින සීමාවන්ද පහත පරිදි සංශෝධනය කෙරේ.

| බල අධිකාරිය | | ශ්‍රී ලංකා රජයේ අරමුදල් යොදවනු ලබන කොන්ත්‍රාත්තු | | විදේශ අරමුදල් යොදවනු ලබන කොන්ත්‍රාත්තු | |
|---|---|---|---|---|---|
| | | පවතින සීමාව | සංශෝධිත සීමාව | පවතින සීමාව | සංශෝධිත සීමාව |
| දෙපාර්තමේන්තු / ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටු සඳහා | **වැඩ -** අවම වශයෙන් සීමිත මිල ගණන් 5 ක් කැඳවීමෙන් | රු.මි. 2 දක්වා | රු.මි. 10 දක්වා | රු.මි. 5 දක්වා | රු.මි. 15 දක්වා |
| | **භාණ්ඩ හා සේවා -** අවම වශයෙන් සීමිත මිල ගණන් 5 ක් කැඳවීමෙන් | රු.මි. 2 දක්වා | රු.මි. 10 දක්වා | රු.මි. 3 දක්වා | රු.මි. 15 දක්වා |
| | **භාණ්ඩ හා සේවා -** අවම වශයෙන් සීමිත මිල ගණන් 3 ක් කැඳවීමෙන් | රු.මි. 1 දක්වා | රු.මි. 5 දක්වා | රු.මි. 1 දක්වා | රු.මි. 5 දක්වා |
| ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු සඳහා | **වැඩ -** අවම වශයෙන් සීමිත මිල ගණන් 5 ක් කැඳවීමෙන් | රු.මි. 1 දක්වා | රු.මි. 2 දක්වා | රු.මි. 1 දක්වා | රු.මි. 2 දක්වා |
| | **භාණ්ඩ හා සේවා -** අවම වශයෙන් සීමිත මිල ගණන් 5 ක් කැඳවීමෙන් | රු.500,000 දක්වා | රු.මි. 1 දක්වා | රු.500,000 දක්වා | රු.මි. 1 දක්වා |

6. අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ ඉහත සංශෝධිත සීමාවන් අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ඉදිරියේදී යථාවත් කෙරෙන අතර එතෙක් දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුවල කටයුතු බාධාවකින් තොරව කරගෙන යාමට මෙම සීමාවන් දිසාපති / දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට 2014.06.01 දින සිට අදාළ කරගන්නා මෙන් සියළු දිසාපති / දිස්ත්‍රික් ලේකම්වරුන් දැනුවත් කළ යුතු වේ.

7. මේ සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2014.05.28 දිනැති ලිපිය අවලංගු කරනු ලබන අතර ඒ වෙනුවට මෙම ලිපිය අදාළ කරගන්නා ලෙස දන්වමි.

පී. අල්ගම
රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් : සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්